(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 12(2).]

# පාර්ලිමේන්තුවේ අංක 12 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2014 අගෝස්තු මස 22 වැනි සිකුරාදා

## 2014 සැප්තැම්බර් මස 09 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි 21 දිනැති අංක 1872/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 19 දිනැති අංක 1863/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2014 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2581/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3240/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/'13

ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ "මහ සමයම" ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3919/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අඹ, කෙසෙල්, ගස්ලබු වැනි පළතුරු කල්තබා ගැනීමට සහ ඉක්මනින් ඉදවීමට ඇතැම් ව්‍යාපාරිකයින් විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බව පිළිගන්නේද;

(ii) එලෙස භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල රසායන විද්‍යාත්මක නාම හා වෙළඳ නාම කවරේද;

(iii) එම රසායනික ද්‍රව්‍ය අතරින් මිනිස් සිරුරට අහිතකර ද්‍රව්‍ය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළතුරු ඉදවීමට සහ කල්තබා ගැනීමට මිනිස් සිරුරට අහිතකර රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා ව්‍යාපාරිකයින් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) 2011 සහ 2012 වර්ෂවල නීතියේ රැහැනට හසුකර ගන්නා ලද එවැනි ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් දඬුවම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලොක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4506/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා දහයක් මිලදී ගැනීමේ සැලසුමක් ඇති බව දන්නේද;

(ii) මිලදී ගැනීමට අපේක්ෂිත එම ගුවන් යානා සඳහා වැය කිරීමට නියමිත මුදල කොපමණද;

(iii) එම ගුවන් යානා මිලදී ගන්නේ කුමන රටකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම 2013 ජනවාරි සිට මේ දක්වා ලැබූ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධික පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා මිලදී ගැනීමට ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම නව ගුවන් යානා මිලදී ගැනීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4588/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සූදු බදු සහ අනෙකුත් ආශ්‍රිත බදු ගෙවීම පිණිස "මරීනා කලම්බු" හෝ වෙනත් සමාන නමකින් "කැසිනෝ" ආයතනයක් ලියාපදිංචි කොට තිබේද;

(ii) එම ආයතනය පළමු වරට ලියාපදිංචි කොට තිබෙන්නේ කවදාද;

(iii) ඉහත කී කැසිනෝ ආයතනය ලියාපදිංචි කොට තිබෙන්නේ කවර නාමයක් (පුද්ගලයකු හෝ සමාගමක්) යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4590/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් පිළිබඳව පවත්වා ගෙන යනු ලබන ලේඛනයක් අමාත්‍යාංශයේ තිබේද;

(ii) ඒ අනුව දැනට ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සියලු ආයතන මධ්‍යම රජයේ හෝ පළාත් සභා යටතේ ලියාපදිංචි කර තිබේද;

(iv) පෙර පාසල් ලියාපදිංචි කිරීමේදී යොදා ගන්නා නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන්ට සහ පාලිකාවන්ට තිබිය යුතු බවට අමාත්‍යාංශය මගින් පිළිගත් අවම සුදුසුකම් කවරේද;

(ii) එකී පාලිකාවන් සහ ගුරුවරුන් විසින් නියමිත සුදුසුකම් සපුරා තිබේද;

(iii) පෙර පාසල් හා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට හා ඒවා විධිමත් කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4741/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයිනේ ඇති පාසල් අතරින් 6 වැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන පාසල් කවරේද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති එවැනි පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල සේවයේ නියුතු සංගීත, නැටුම්, චිත්‍ර හා නාට්‍ය හා රංග කලාව යන සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිස්ත්‍රික්කයේ ඇති සෞන්දර්යය ගුරු අවශ්‍යතාව ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4845/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ප්‍රමිතියෙන් තොර බලාගාරයක් බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රකාශකර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) එම බලාගාරයේ,

(i) පළමුවන අදියර වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදල හා වැය කළ මුදල කොපමණද;

(ii) ප්‍රමිතිය, උපකරණ හා ක්‍රියාකාරී තත්ත්වය සම්බන්ධයෙන් අදාළ ඉදිකිරීම් සමාගම සමග වගකීම් කාලයක් සහිත ගිවිසුමකට එළැඹ සිටියේද;

(iii) ප්‍රමිතියෙන් තොර තත්ත්වය හා සිදුවන අක්‍රියවීම් සම්බන්ධයෙන් බලාගාරය ඉදිකළ සමාගමට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) අලුත්වැඩියාවන්වලට සහ එම කාලය තුළ අහිමි වූ විදුලි බලය ලබා ගැනීමට වැය වූ අතිවිශාල මුදල ඊට වගකිව යුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

(v) පළමුවැනි අදියර නිසි පරිදි ඉදි නොකළ සමාගම විසින්ම එහි ඊළඟ අදියරයන්ද ඉදිකරනු ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී මහජනතාවට ප්‍රතිලාභ ලබා දිය හැකි වන පරිදි විදුලිය නිපදවීමට සැලසුම් කර තිබේද;

(ii) විදුලි බිල අඩුවීමට හේතු වන එම සැලසුම දින වකවානු සහිතව කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4871/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) නොරොච්චෝල තාප බලාගාරයේ බිඳ වැටීම් සහ නඩත්තු කටයුතු හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දැමීම නිසා ජාතික විදුලිබල පද්ධතියට මේ දක්වා අහිමි වූ විදුලි ධාරිතාවය කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 පෙබරවාරි 13 වැනි දින නොරොච්චෝල තාප බලාගාරයේ කන්ඩෙන්සර් පද්ධතියට ලුණු හෝ ඒ හා සමාන කිසියම් රසායනික ද්‍රව්‍යයක් එකතු කර ඇති බවට ඉදිරිපත් වූ ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව මේ වන විට සිදු කර ඇති පරීක්ෂණ කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයෝ කවුරුන්ද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4945/'14

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එවකට ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයට අයත්ව තිබූ "බදුලුවෙල රක්ෂිතයේ" වර්ෂ 50 - 60ක් පමණ පැරණි තේක්ක වගාවක් ඇති බවත්;

(ii) කිසියම් පුද්ගලයෙකු කූට ලිපි ලේඛන සකසා එම ඉඩම පෞද්ගලික සින්නක්කර ඉඩමක් ලෙස භුක්ති විඳින බවත්;

(iii) පුද්ගලයන් කිහිප දෙනෙකු රජයට අයත් එම තේක්ක වගාව විනාශ කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ ගණනාවක් ආරක්ෂිතව තිබූ බදුලුවෙල රක්ෂිතයේ තේක්ක වනය අනවසර පදිංචිකරුවන්ගෙන් රැක ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4962/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂය තුළ පොහොර සහනාධාරය ලබා දුන් ගොවීන් සංඛ්‍යාව එක් එක් බෝග වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාර ක්‍රමය යටතේ පසුගිය වර්ෂයේ සිට ලබා දුන් රු.350.00ක පොහොර බෑගයක් සඳහා රු.150.00ක අමතර මුදලක් රක්ෂණාවරණයක් වශයෙන් අය කර ගත් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, සහනාධාර යටතේ ලබා දෙන එක් පොහොර බෑගයක් වෙනුවෙන් රු.150.00ක මුදලක් අමතරව අය කර ගනිමින් ආරම්භ කළ රක්ෂණාවරණයේ පදනම කවරේද;

(iii) එම රක්ෂණාවරණය ආරම්භ කළ දින සිට මේ දක්වා ගොවීන්ගෙන් අය කර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(iv) එකී රක්ෂණාවරණය යටතේ හිමිකම් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5167/'14

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 179 ඇලපිටිවල ග්‍රාම නිලධාරී වසමේ, නවම්මහර ග්‍රාමයේ ඇති රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනවසර පදිංචිකරුවන්ගේ පවුල්වල ගෘහ මූලිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පවුල් අතරින් පවුල් වැඩි සංඛ්‍යාවක් වසර 20කට වැඩි කාලයක් ඉහත ග්‍රාමයෙහි පදිංචිව සිටියද, මෙතෙක් ඔවුන්ගේ ඉඩම් වෙනුවෙන් ස්ථිර ඔප්පුවක් හෝ තාවකාලික බලපත්‍රයක් හෝ ලබා දීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) එම පිරිස පදිංචි ඉඩම් සඳහා ස්ථිර ඔප්පු ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ස්ථිර ඔප්පු ලබා දෙන තෙක් තාවකාලික බලපත්‍ර ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5359/'14

ගරු ඒ. විනායගමූර්ති මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පලාලි ගුවන් තොටුපළේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එය මහජනතාව සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 සැප්තැම්බර් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2642/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් විසින් මූලිකත්වය දරනු ලබන පවුල්වලට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමු වීම සඳහා එක් පවුලකට රුපියල් ලක්ෂ 2කට නොවැඩි වූ ණය මුදලක් සහන පොලියක් යටතේ ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3247/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන් එක් එක් බදු වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා, කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබාදීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබාදීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3963/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර මහ නගර සභාවේ, ගොහාගොඩ, කසළ බැහැර කිරීමට යොදාගන්නා ස්ථානයේ ජනනය වන ක්ෂීරණ මහවැලි ගඟට එක්වන බව දන්නේද;

(ii) ඉහත ස්ථානයෙන් බැහැරවන ක්ෂීරණයේ පී.එච් අගය, විද්‍යුත් සන්නායකතාව, පාරදෘශ්‍යතාවය, උෂ්ණත්වය, තෙල් සහ ග්‍රීස්, ජෛව ඔක්සිජන් ඉල්ලුම (BOD) සහ රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD) යන භෞතික හා රසායනික ලක්ෂණයන්ට අදාළ අගයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්ෂීරණයේ අඩංගු ක්‍රෝමියම්, කැඩ්මියම්, ඊයම් සහ රසදිය යන බැර ලෝහවල සහ පොස්පේට් සහ නයිට්‍රේට් යන සංඝටකවල සංයුතිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොහාගොඩ කසළගොඩ නිසා මහවැලි ගඟට අඛණ්ඩව එකතුවන බැර ලෝහ සහිත ක්ෂීරණයන් භූගත ජල පද්ධතිය තුළට එකතුවීම හානිකර තත්ත්වයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4181/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඇහැලියගොඩ - නාපාවල මාර්ගය සහ ඇහැලියගොඩ - පනාවල මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුමට අනුව,

(i) එම මාර්ග සංවර්ධනය කිරීමට වැයවන උපරිම මුදල කොපමණද;

(ii) එම සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ඉවත්කළ යුතු නිවාස, වෙළඳසැල් සහ වෙනත් ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ඉවත් කරනු ලබන නිවාස, වෙළඳසැල් හා වෙනත් ගොඩනැගිලි වෙනුවෙන් වන්දි ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4625/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල්වල ඉතිහාසය විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම දැනට වර්ෂ 1 ½ක පමණ කාලයක සිට නතර කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දරුවන්ට ඉතිහාසය විෂයය ඉගැන්වීම නොවැදගත් කරුණක් ලෙස රජය සලකන්නේද;

(iv) නොඑසේ නම්, පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉතිහාසය ඉගැන්වීමට නොහැකි වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4637/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කෘෂි බීජ ආනයනය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) බීජ ආනයනය කරන ආයතනයකට ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(iii) එම ආයතනවල කෘෂි බීජ පිළිබඳ දැනුම ඇති අය අනිවාර්යයෙන් සේවය කිරීමේ අවශ්‍යතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ට තිබිය යුතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය මගින් බීජ ආනයනය කරනු ලබන ආයතන තිබේද;

(ii) එම ආයතන මගින් ගෙන්වනු ලබන බීජ වර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ ආයතනවල නම් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) පෞද්ගලික අංශයේ ආයතන මගින් ආනයනය කරනු ලබන බීජ පරීක්ෂණයට භාජනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ආයතනයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4734/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් වර්ෂයක් තුළදී එයට අලුතින් එක් වන විශ්‍රාමිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම ගන්නා වයස සම්පූර්ණ කිරීමෙන් පසු තම විශ්‍රාම වැටුප ලබා ගැනීමට විශ්‍රාමිකයාට ගත වන කාල සීමාව කොපමණද;

(ii) ඒ අනුව විශ්‍රාම වැටුප ලැබීමේදී යම් ප්‍රමාදයක් සිදුවන්නේ නම්, එයට හේතු ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන ඇති කරුණු කවරේද;

(iii) විදේශගත විශ්‍රාමිකයන් මෙන්ම මෙරට විශ්‍රාමිකයන් ජීවතුන් අතර සිටී ද යන්න නිශ්චය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම ක්‍රමවේදය තුළින් අවශ්‍ය තොරතුරු නිසි ආකාරයෙන් ලබාගත හැකිවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013 වර්ෂයේ විශ්‍රාම ගිය, මෙතෙක් සිය විශ්‍රාම පාරිතෝෂිකය ලබා ගැනීමට නොහැකිව සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ විශ්‍රාම පාරිතෝෂික නොලැබීමට හේතු කවරේද;

(iii) විශ්‍රාම පාරිතෝෂිකය ලැබීම ප්‍රමාද වීම, විශ්‍රාම වැටුප ලබා ගැනීම ප්‍රමාද වීමට ද හේතු වී ඇති බව පිළිගන්නේද;

(iv) ඉහත සඳහන් ප්‍රමාදයන් වැලැක්වීමට අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4763/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා කෘෂි බීජ පැකට් බෙදාහැරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වූයේද;

(ii) එසේ නම්, එම වැඩ සටහන යටතේ බෙදා හරින ලද බීජ පැකට් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) එම වැඩ සටහන තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4852/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුදු ව්‍යාපාර පවත්වාගෙන යාම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා නිකුත් කර ඇති ලියාපදිංචි සහතික සංඛ්‍යාව කොපමණද;

(ii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද්දේ කවර පුද්ගලයින් වෙතද;

(iii) එකී එක් එක් ලියාපදිංචි සහතිකය නිකුත් කරන ලද නිවැරදි දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4960/'14

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශය විසින් ධීවරයින් සඳහා බෝට්ටු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එම බෝට්ටු ලබාදීමට ධීවරයන් තෝරා ගන්නා ලද පදනම කවරේද;

(iii) එක් එක් බෝට්ටු වර්ගය සඳහා ධීවරයන් වෙත ලබා දෙන සහනාධාරයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයන්ට ලබා දෙන එම බෝට්ටු වර්ග සහ ඒවායේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ධීවර බෝට්ටුවක නිෂ්පාදන පිරිවැය එක් එක් බෝට්ටු වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වයඹ පළාත් සභාව මගින් 2010 වර්ෂයේ සිට මේ දක්වා ලබාදී ඇති ධීවර බෝට්ටු සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4963/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ උපාධි පාඨමාලාව සඳහා බඳවා ගන්නා ශිෂ්‍යයින් සංඛ්‍යාව අඩු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම උපාධි පාඨමාලාව ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) පාඨමාලාව හැදෑරීම සඳහා එක් වර්ෂයකට බඳවා ගැනීමට තීරණය කර ඇති අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වර්ෂයේ දී කළමනාකරණ උපාධිය සඳහා බඳවා ගත් අභ්‍යන්තර සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5022/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ, මිරිස්වත්ත සිට වතුරුගම දක්වා මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය වන සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා සැකසූ ඇස්තමේන්තුවෙහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීම සඳහා පිළිගත් ටෙන්ඩර් ක්‍රියා මාර්ග අනුගමනය කළේද;

(iii) විධිමත් ටෙන්ඩර් ක්‍රියා මාර්ග අනුගමනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගත් වර්ෂය කවරේද;

(ii) අත්පත් කර ගනු ලැබූ ඉඩම් සඳහා වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම වන්දි ගෙවීම් සිදු කළ වර්ෂය කවරේද;

(iv) මේ වන විට ඉහත පරිදි අත්පත් කරගත් සියලුම ඉඩම් සඳහා වන්දි ගෙවා අවසන් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5160/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ව සිට පසුව වෙනත් රටක පුරවැසිභාවය ලැබීම නිසා ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහිමි වූ තැනැත්තන් විසින් ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සලකා බැලීමට අදාළව අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද;

(ii) එවැනි අයදුම්පත් සලකා බැලීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් පවතින බව දන්නේද;

(iii) ඉහත කී ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කළ මෙතෙක් සලකා බලා අවසන් නොකරන ලද අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ 2010.01.01 දිනෙන් පසු ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5194/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013.07.25 දිනට සී/ස කොළඹ දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ ආශ්‍රිත සාමාජික ණය මුදල්වල ඇති හිඟ වාරිකවල තත්ත්වය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නෙහිද ?

(ආ) (i) හිඟ වාරික 2 ට වැඩි ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය ලබාගත් අයගේ නම් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) සී/ස කොළඹ දිස්ත්‍රික්කයේ සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයට අය වීමට ඇති හිඟ ණය වාරික අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) සමූපකාර පනත අනුව ග්‍රාමීය බැංකු සංගමයට ණය දීමේ හැකියාව ඇත්තේ සාමාජික බැංකුවලටද; නැතහොත්, පුද්ගලයින්ටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2652/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ප්‍රධාන නගර 25ක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, පිහිටුවා ඇති එම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රධාන නගරය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3248/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රේගුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3718/'13

ගරු අනුර දිසානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ හතර තුළ එක් එක් කන්නයේදී රජය මගින් මිලදී ගන්නා ලද මුළු වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වී ප්‍රමාණයන් එක් එක් කන්නයේ සමස්ත නිෂ්පාදනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) පසුගිය වර්ෂයේදී වී මිලදී ගැනීම සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) පසුගිය වර්ෂ හතර තුළ වී මිලදී ගැනීම සඳහා මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් කන්නයේ මිලදී ගන්නා ලද වී තොග, එක් එක් අවස්ථාවන්හිදී අලෙවිකරන ලද මිල ගණන්, මිලදී ගත් පුද්ගලයින් සහ එම එක් එක් පුද්ගලයා මිලදී ගත් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත වී මිලදී ගැනීම් හරහා ලබා ඇති ලාභය / අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලාභයක් සිදුවී තිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4053/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නකල්ස් රක්ෂිත වනාන්තරයේ අනවසර එනසාල් වාඩි ගලවා ඉවත් කිරීම සඳහා අධිකරණයෙන් ලබා දුන් නෙරපුම් නියෝගය ක්‍රියාත්මක කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් විසින් අවශ්‍ය සහයෝගය ලබා නොදීම නිසා නැවතත් එම ප්‍රදේශවල අනවසර එනසාල් වගාවන් සිදු කරන බවත්;

(ii) අනවසර එනසාල් වගාව හේතුවෙන් නකල්ස් රක්ෂිතයේ ඉහළ කඳුකර වනාන්තර පද්ධතියේ පැවැත්මට බාධා ඇතිවන බවත්;

(iii) වන සංරක්ෂක ජනරාල් විසින් යොමු කරන ලද 2012.07.30 දිනැති ලිපිය මගින් ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් ලබාගන්නා තෙක් ඉහත අධිකරණ නියෝගය ක්‍රියාත්මක නොකරන ලෙස දන්වා ඇති බවත්;

(iv) එලෙස ප්‍රකාශ කර වර්ෂයකට වැඩි කාලයක් ගතවී ඇතත්, මේ දක්වා ඒ සඳහා උපදෙස් ලබාගෙන නොමැති බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් අධිකරණ නියෝගය ක්‍රියාත්මක කරවීමට අදාළ නිලධාරීන්ට නැවතත් නියෝග කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4293/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිවේරිය, රතුපස්වල ප්‍රදේශයේ පානීය ජලය දූෂණයවීමට හේතුවූයේ යැයි සැලකෙන රබර් අත් ආවරණ කර්මාන්තශාලාවේ නම කවරේද;

(ii) එම කර්මාන්තශාලාවේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම කර්මාන්තශාලාවේ කොටස් හිමි සමාගම් හෝ ආයතන කවරේද;

(iv) මෙම කර්මාන්තශාලාවට අදාළව පරිසර තත්ත්ව පරීක්ෂාවක් සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4626/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජගිරියේ පිහිටි රවී වෙත්තසිංහ මහතාගේ පවුලට අයත් අක්කර 3 ½ක ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ඉඩම පවරා ගත් පදනම කවරේද;

(iii) එම ඉඩම පවරා ගැනීමේ නීත්‍යානුකූලභාවයක් තිබේද;

(iv) එම ඉඩම පවරා ගැනීමෙන් පසුව එම භූමියේ සිදු කරනු ලබන පොදු කාර්යය කවරේද;

(v) ඉඩම පවරා ගැනීමේදී පර්වසයක් වෙනුවෙන් ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4638/'13

ගරු පී. හැරිසන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2011 වර්ෂයේ අයවැයෙන් රුපියල් මිලියන 300ක් වෙන් කරන ලද බව දන්නේද;

(ii) එම මුදල් වැය කර ආරම්භ කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ආයතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිෂ්පාදන ආයතන ආරම්භ කර ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) ඒ ඒ දිස්ත්‍රික්කවල ආරම්භ කර ඇති එම ආයතනවල නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ)(i) හි සඳහන් මුදල්වලින් පුද්ගලික අංශයේ අය වෙනුවෙන් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මුදල් ආධාර හා උපකරණ ලබා දීම සහ සම්මන්ත්‍රණ හා

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදිය සිදුකර ඇත්නම්, එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනයන් හා ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණයන් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) එම මුදල් වැය කර ආරම්භ කරන ලද කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් වෙළෙඳපොළට වාර්ෂිකව නිකුත් කරනු ලබන පොහොර කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද;

(ii) සීමාසහිත ලංකා පොහොර සමාගම මගින් රු. 400ක මිලකට කාබනික පොහොර මිලදී ගන්නා බවට කළ සඳහනට අනුව, දැනට මිලදී ගෙන ඇති පොහොර ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4735/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට දිවයිනේ ඇති ගුරු අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් දැනට ක්‍රියාත්මකව පවතින ගුරු අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ දැනට පුහුණුව ලබන ගුරු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු අභ්‍යාස විද්‍යාලය ඉංග්‍රීසි ගුරු පුහුණුව සඳහා පමණක් වෙන් වී තිබේද;

(iii) නොඑසේ නම්, එම ගුරු විද්‍යාලයේදී වෙනත් විෂයයන් සඳහා ද පුහුණුව ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විෂයයන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ සිසුන්හට නේවාසික පහසුකම් තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) මෑතකදී එම ගුරු විද්‍යාලයේ ගොඩනැගිලි පිළිසකර කර ඇත්තේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එම පිළිසකර කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4764/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවිනැගුම චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ගම් කුකුල් පැටවුන් බෙදා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම වැඩපිළිවෙළ තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4854/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2002 වර්ෂයේ සිට 2013 දක්වා එක් එක් වර්ෂය සඳහා අපනයන / දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය (අපනයන දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස) එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4961/'14

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය ආසන්නයේ පිහිටා ඇති දූපත් 14 ක් සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් යෙදවීමට කටයුතු කර ඇති බවත්;

(ii) සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගෙන ඇති එම දූපත් ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ධීවර ජනතාව තම භූමියේ අයිතිය අහිමි වීමෙන් ඉතා දුක්ඛිත තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සංචාරක ව්‍යාපාරයට දූපත් යෙදවීම නිසා තම ගම් බිම් අහිමි වන ධීවරයින්ගේ අයිතීන් රැකදීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) සිය භූමිය අහිමි වන පාරම්පරික ධීවර ජනතාවට ප්‍රමාණවත් විසඳුම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සංචාරක ව්‍යාපාරය සඳහා ඉහත සඳහන් දූපත් 14 ලබාදුන් ආයතන හෝ සමාගම්වල නම් කවරේද;

(ii) එම ආයතන හෝ සමාගම් වෙත එම දූපත් ලබා දුන් පදනම කවරේද;

(iii) ඉහත (ඇ) (i) හි සඳහන් සමාගම් වෙත එම එක් එක් දූපත ලබා දී ඇති මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5023/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත් ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනය තෝරා ගනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනය සිදු කරන ඉහත සඳහන් දුම්රිය ස්ථානයේ සංවර්ධනය සඳහා වූ යෝජිත සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු සඳහා වැය වන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5032/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට සිටින මී ගව ගහනය කොපමණද;

(ii) වැඩිම මී ගව ගහනයක් සිටින දිස්ත්‍රික්ක පහ අනුපිළිවෙළින් කවරේද;

(iii) රජයේ ගොවිපළවල් යටතේ ඇති කරනු ලබන මී ගවයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති කරනු ලබන මී ගව වර්ගයන්හි (breeds) නම් කවරේද;

(v) වාර්ෂික මී කිරි නිෂ්පාදනය ලීටර් කොපමණද;

(vi) මී ගවයින්ගේ කිරි සහ එළ ගවයින්ගේ කිරි පෝෂණීය ගුණයෙන් එකිනෙක වෙනස් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මී ගව සම්පත දේශීය කිරි නිෂ්පාදනය තුළ කාර්යක්ෂමව යොදා ගැනීම සඳහා වැඩපිළිවෙළක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

(iii) මී ගවයින් සම්බන්ධ ව්‍යාපෘති වෙනුවෙන් 2013 වර්ෂයේදී වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5172/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව පිණිස වූ පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීම අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම කෙටුම්පත අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව නීති පැනවීම සඳහා ප්‍රමාදයක් සිදු වීමට හේතුව කවරේද;

(iv) එකී ප්‍රමාදය සඳහා වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5195/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2013 ජනවාරි මස 01 වැනි දින සිට 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ මුදල් වර්ෂය සඳහා එක් එක් ආයතනය වෙනුවෙන් නිදහස් කරනු ලැබූ මුළු අක් මුදල් (Imprests) ප්‍රමාණය පිළිවෙළින් පුනරාවර්තන වැය, මූලධන වැය හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් යන ශීර්ෂ යටතේ කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2014 ජනවාරි මස 01 වැනි දින සිට, 2014 අප්‍රේල් මස 30 වැනි දින දක්වා එක් එක් ආයතනය වෙත නිකුත් කරනු ලැබූ අක් මුදල් ප්‍රමාණය පිළිවෙළින්, පුනරාවර්තන වැය, මූලධන වැය සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් යන ශීර්ෂ අනුව කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2674/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සිංගප්පූරුවේ "බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්" සමාගම වෙතින් පසුගිය කාලයේ ගෙන්වූ "හොඳ ගුවන්යානා තෙල්" සමඟ වෙනත් ටැංකියක 'බාල ගුවන්යානා තෙල්' මෙට්‍රික් ටොන් 7500ක් ආනයනය කළේද;

(ii) ගුවන් යානා තෙල් ආනයනයේදී සිදුවී ඇති ඉහත අක්‍රමිකතාව නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවූ පාඩුවේ වටිනාකම රුපියල්වලින් සහ ඇමරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අක්‍රමිකතාව සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව මේ දක්වා ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත සඳහන් තෙල් ආනයනයෙන් පසුව "බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්" සමාගමෙන් ඉන්ධන මිල දී නොගත යුතු බවට ටෙන්ඩර් කමිටුව ඒකමතිකව තීරණයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3249/'12

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3940/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර, ශ්‍රී දළදා මාළිගාවට මීටර් 500 ක් ආසන්නයේ පවත්වාගෙන යනු ලබන මත්පැන් අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මත්පැන් අලෙවිසැල් සඳහා අවසර ලබා දී ඇති අය කවුරුන්ද;

(iii) මත්පැන් අලෙවිසැලක් සඳහා බලපත්‍රය ලබාදීමේදී පාසල්වල හා පන්සල් ඇතුළු පූජනීය ස්ථානවල සිට එම මත්පැන් අලෙවිසැලට තිබිය යුතු නියමිත දුර ප්‍රමාණය කොපමණද;

(iv) එවැනි බලපත්‍රයක් ලබාදීමේදී සලකා බලනු ලබන අනෙකුත් සීමාවන් කවරේද;

(v) ඉහත (iii) හා (iv)හි සඳහන් සීමාවන් අනුව දළදා මාළිගාව ආසන්නයේ පිහිටි ඉහත මත්පැන් අලෙවිසැල් නීති විරෝධී වන්නේද;

(vi) ඒ අනුව, එම මත්පැන් අලෙවිසැල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4054/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පදවිය වන රක්ෂිතයට අයත් කැලෑ ඉඩම් අක්කර 31875ක් මහවැලි අධිකාරිය යටතට පවරාගෙන ජනතාව පදිංචි කිරීමේ සැලැස්මක් පවතින බවත්;

(ii) ස්වභාවික සම්පත් බහුල වන රක්ෂිත ප්‍රදේශ මහවැලි අධිකාරිය යටතට පවරාගෙන විවිධ ව්‍යාපාරිකයන්ට බදුදීම සඳහා කටයුතු කරන බවට ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බහුලව අලි ගැවසෙන ප්‍රදේශයක් වන ඉහත (අ) (i) හි සඳහන් වනාන්තර පද්ධතිය එළි පෙහෙළිකර ජනතාව පදිංචි කිරීම නිසා අලි-මිනිස් ගැටුම උග්‍ර විය හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වන රක්ෂිත ඉඩම් මහවැලි අධිකාරිය යටතට පැවරීම නවතා දැමීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4294/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු රෝගීන්ට රජයේ රෝහල්වල ලබාදුන් ඩෙක්ස්ට්‍රන් 40 (DEXTRAN 40) නමැති සේලයින් වර්ගය ආනයනය කළ ආයතනයේ නම කවරේද;

(ii) එම සේලයින් වර්ගයේ තත්ත්වය පිළිබඳ යම් පරීක්ෂාවක් සිදුකර තිබේද;

(iii) 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල සීමාව තුළදී එම සේලයින් වර්ගය ලබා දී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සේලයින් වර්ගය පිළිබඳව පැමිණිලි හෝ චෝදනා ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4627/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ අයවැය ලේඛනයට අනුව එම වර්ෂය තුළ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය මගින් ඉදිකිරීමට යෝජිතව තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයවැය යෝජනා පරිදි සාදා නිම කළ අලුත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිවලින් රජයේ සේවකයින්ට ලබා දුන් නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4639/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ගොවිපළවල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නඩත්තුව හා විමර්ශන කටයුතු සඳහා සේවයේ යොදවා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ගොවිපළ සඳහා රජය මගින් වැය කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4736/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ගම්මානයේ ඇති ලාහුගල මහ විදුහලෙහි අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි පැවැත්වෙන පන්ති සංඛ්‍යාව කොපමණද;

(iii) විදුහල්පතිවරයාද ඇතුළුව එහි ආචාර්ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලාහුගල ගම්මානයේ කුඩා දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා ඇති ප්‍රාථමික පාසල කවරේද;

(ii) මෑතකදී එම පාසල සම්බන්ධව ඇතිවූ ගැටලුව කවරේද;

(iii) එම ගම්මානය සඳහා නැගෙනහිර පළාත් සභාවේ ද අනුමතිය ඇතිව මෑතකදී ප්‍රාථමික පාසලක් ආරම්භ කළේද;

(iv) එම පාසලේ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් පාසල් පළාත් සභා යටතේ පාලනය වුවත්, පොදුවේ එම පාසල් දරුවන්ට බාධාවකින් තොරව අධ්‍යාපනය ලැබීමේ පහසුකම් සැපයීම මධ්‍යම රජයේ වගකීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පාසල්වල දැනට පවතින ගැටලු නිරාකරණය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4766/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ,

(i) වී මිලදී ගැනීම සඳහා ස්ථාපිත කර ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) වී ගබඩා කිරීම සඳහා ගබඩා පහසුකම් කොපමණ ප්‍රමාණයක් තිබේද;

(iii) වී අස්වැන්නෙන් රජය මිල දී ගන්නා වී ප්‍රමාණයේ ප්‍රතිශතය කොපමණද;

(iv) වී අස්වැන්න එම දිස්ත්‍රික්කය තුළදීම සහල් බවට පත් කර බෙදා හැරීමේ ක්‍රමවේදයක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5033/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික වෛද්‍ය රසායනාගාර පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය හා ලියාපදිංචිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, මේ වන විට ලියාපදිංචි කර ඇති පෞද්ගලික වෛද්‍ය රසායනාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් පෞද්ගලික වෛද්‍ය රසායනාගාරවල කටයුතු අධීක්ෂණය කිරීමක් සිදු කරන්නේද;

(ii) එම ආයතන වෙතින් රෝගීන්ට නිරවද්‍යතාවයෙන් යුතු වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා ගැනීමේ අවස්ථාව සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) නිරවද්‍ය වෛද්‍ය වාර්තා ලබා දීමට අපොහොසත් වන ආයතන සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iv) වෛද්‍ය වාර්තා නිකුත් කිරීමේදී අක්‍රමිකතා සිදු කරනු ලබන ආයතන සම්බන්ධයෙන් මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආයතනයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5173/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වසර තුනක කාලය තුළ එක් එක් මාසයට අදාළව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බොරතෙල් බැරලයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදලේ සාමාන්‍ය (Average) අගය කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) ජාත්‍යන්තර වෙළඳපොළේ තෙල් මිල අඩු වීමෙන් ඇති වූ වාසිය ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් වෙත ලබා දීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අපොහොසත් වීමට හේතුව කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5184/'14

ගරු තලතා අතුකෝරල මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඩා තේ ඉඩම්වල පාංශු හා ජල සංරක්ෂණයට රජයේ සහනාධාර ලබාදීමේ වැඩපිළිවෙළක් 2014 අයවැය යෝජනාවලට ඇතුළත් කර තිබේද;

(ii) එසේ නම්, තේ අක්කරයකට ලබා දෙන මුදල කොපමණද;

(iii) මේ වන විට එම වැඩ සටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම දිස්ත්‍රික්ක අතරින් ඉහත සහනාධාර මුදල සම්පූර්ණයෙන් ලබා දී ඇති හා කොටස් වශයෙන් ලබා දී ඇති දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම සහනාධාරය ලබා දෙන කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දිස්ත්‍රික්ක 08 ක කුඩා තේ වතු හිමියන් සඳහා එම සහනාධාර මුදල ලබා දිය යුතු නමුත්, පසුගිය කාලයේ පළාත් සභා මැතිවරණ පැවති දිස්ත්‍රික්ක සඳහා පමණක් ඊට අදාළ අත්තිකාරම් මුදල් ලබා දෙන ලෙස දන්වා ඇති අතර සෙසු දිස්ත්‍රික්ක තුළ එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5196/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරවල නම් කවරේද;

(iii) අලුතින් ඉදිකිරීමට යෝජිත ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර ස්ථාපිත කරන ප්‍රදේශ කවරේද;

(v) එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(vi) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් දැනට ජනනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(vii) එය ලංකාවේ විදුලිබල අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5360/'14

ගරු ඒ. විනායගමූර්ති මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වලිකාමම් උතුර ප්‍රදේශයේ, තායිට්ටි හි පුද්ගලයන් 3000ක් සහ මයිලිට්ටි හි පුද්ගලයින් 5000ක් මේ වන තෙක් නැවත පදිංචි කරවා නොමැති බවත්;

(ii) ඔවුන් වර්ෂ 20 ක පමණ කාලයක සිට කඳවුරු තුළ සිටින බවත්;

(iii) ශ්‍රී ලංකා යුද හමුදාව ඔවුන්ට නැවත පදිංචිවීමට ඉඩ නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පුද්ගලයින් නැවත පදිංචි කරවීමට නියමිත දිනය කවරේද;

(ii) එම පුද්ගලයින්ට නැවත පදිංචිවීමට ඉඩ දෙන ලෙසට නියෝගයක් ශ්‍රී ලංකා යුද හමුදාව වෙත නිකුත් කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5101/’14

ගරු විජිත බේරුගොඩ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සමස්ත සිසුන් සංඛ්‍යාව;

(ii) එම වර්ෂයේදී විභාගය සමත් වූ සංඛ්‍යාව;

(iii) 2011, 2012 සහ 2013 වර්ෂවලදී ඉහත විභාගයෙන් සමත් වූ සිසුන්ගේ ප්‍රතිශතය;

(iv) 2012 වර්ෂය හා සැසඳීමේදී 2013 වර්ෂයේ දී ඉහත විභාගයේ ප්‍රතිඵල වැඩි වී තිබේ නම්, එම වැඩි වූ ප්‍රතිශතය;

(v) 2013 වර්ෂයේ උක්ත විභාගය සමතුන් අතරින් උසස් පෙළ හැදෑරීමට සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාව;

(vi) එම සිසුන්ගේ ප්‍රතිශතය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මොනරාගල දිස්ත්‍රික්කයේ,

(i) 2013 වර්ෂයේ දී අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) විභාගය සමත් වූ සිසුන් සංඛ්‍යාව;

(iii) වර්ෂ 2006 සිට 2013 දක්වා එක් එක් වර්ෂයේදී එම විභාගය සමත් වූ ප්‍රතිශතය;

(iv) 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල වැඩි වී තිබේ නම්, එම වැඩි වූ ප්‍රතිශතය;

(v) 2013 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල මත අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීමට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව;

(vi) එම සිසුන්ගේ ප්‍රතිශතය;

කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?